# ඔසු වවමු
# ඉසුරු ලබමු



## 6.හීන් බිංකොහොඹ

**උද්භිද නාමය** - Andrographis paniculata

**ශාක කුලය** - ACANTHACEAE

**පොදු සිංහල නම** - හීං බිංකොහොඹ/ වල් බිං කොහොඹ

**සංස්කෘත නාමය** - කාලමේඝ/ භූ නිම්භ

**ද්‍රවිඩ නාමය** - නීල වේම්බු

**ඉංග්‍රීසි නාමය**- Green Chirata/ Kalmegha

**රෝපණ ද්‍රව්‍ය** - බීජ

**ඖෂධ සඳහා ගැනෙන ව්‍යවහාර අංග-**

සම්පූර්ණ පැළෑටියම

### හැදින්වීම

කොහොඹ ශාකය හා කිසිසේත්ම සබඳකමක් නොමැති කොහොඹ කුලයට හෝ අයත් නොමැති වුවද භූ නිබ්බ නමින් හැඳින්වෙන ප්‍රබල ජ්වර නාශක, බලකාරක හා රක්ත ශෝධක ගුණ ඇති ඖෂධයෙකි. පඳුරු වශයෙන් වැඩෙන මෙම පැළෑටිය විශාල ප්‍රදේශයක පැතිරී වැඩෙන විට කළු පැහැති වැහි වලාවක ස්වරූපය ගන්නා නිසා කාලමේඝ නමින් හඳුන්වයි. භූනිම්භ වශයෙන් ඖෂධ යෝගයන්හි යෙදෙන අවස්ථාවල ශ්‍රී ලාංකික ආයුර්වේද වෛද්‍යවරු ඒ සඳහා මෙම කාලමේඝ හෙවත් කිරාත පැළෑටිය භාවිතයට ගනී.

### උද්භිද විද්‍යාත්මක විස්තරය -

කඳ සෙන්ටිමීටර් 75ක් පමණ උසය. පැහැදිලි ලෙස චතුරස්‍රාකාර සිනිඳු පත්‍ර අන්ඩාකාර ඉලිප්සීය සිට ඉලිප්සීය ලංසාකාරය. පත්‍ර සෙන්ටිමීටර් 3.5- 8 හා 1.5 -2.5 අතර වේ. පාදය දෙසට ක්‍රමයෙන් සිහින් වේ.කෝෂ්ඨාෂ්ම සහිතව සියුම් රේඛා සහිතය. පත්‍ර වෘන්ත මිලිමීටර් 3-4කි. ඒකාක්ෂ පුෂ්ප මංජරි අග්‍රස්ථීය හා කක්ෂීය විට පිරමිඩාකාර බහුඅක්ෂ ලෙස ඇත. සෙන්ටිමීටර් 5-20 දිගය. පුෂ්ප වෘන්ත සිහින් හා සිනිඳුය.
ඵලය ස්පෝටිකාවක් වන අතර ඍජුව පිහිටයි. බීජදොළහක් පමණ ඇත.

### කෘෂි විද්‍යාත්මක විස්තරය

තද අව්ව ප්‍රිය කරන හීන් බිංකොහොඹ හොඳින් මෝරා පැසී වියලුණු කළු පැහැති කරල් පොඩි කර හෝ තැටියක බහා වීදුරු හෝ පොලිතීන් ආවරණයෙක් යොදා හිරු එළියේ දී පිපිරීමට හැර කුල්ලකින් පොලා පොතු ඉවත් කර පිරිසිදුකර වෙන්කර ගත හැකිය. එම බීජ කෙලින්ම ක්ෂේත්‍රයේ වැපිරීම හෝ තවන්කර බීජ පැළ සිටුවීම කළ හැකිය.වගාව සඳහා ඇති බීජ ප්‍රමාණය අනුව ක්ෂේත්‍රයේ වැපිරීම හෝ තවන් කර පැළ සිටුවීම තීරණය කළ හැකිය. ග්‍රෑමයකට බීජ 500- 600 ක් පමණ ඇතුළත් වේ. ජනවාරි මුල වගා බිම් එළි කර පෙබරවාරි මස අවසන් වීමට පෙර බීජ වැපිරීම වඩා සුදුසුය. අක්කරයක් සඳහා බීජ කිලෝ පහක් ප්‍රමාණවත් වේ. තමන් සඳහා තෝරා ගත් බීජ පැය අටක් දොළහක් වතුරේ පෙනෙන්නට තබා බීජ මතුපිට හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් වලින් ජීවානුහරණය කර වැලි තවානක තවන් කළ විට දින දහයකදී පැළවේ.

විශාල වගාවක් සඳහා සෙ.මී 75 x300 තවන් පාත්ති සකස්කර මතුපිට ජීවානු හරණය කර පේළි ක්‍රමයට තවන් කරන්න. තවන් පැළ සෙන්ටිමීටර් 10 පමණ උස් වූ විට සෙන්ටිමීටර් 20ක පමණ ගැඹුරු වළවල්වල සෙන්ටිමීටර් 15 සිට 25 අතර පරතරය සිටින සේ කපා කොම්පෝස්ට් පොහොර මිශ්‍රණය දමා සිටුවන්න. පැලේ හොඳින් හැදෙන තුරු දිනපතා ජලය යොදන්න .සිටුවා දින 45ක් පමණ පසු වල් ඉවත් කර පැළ මුලට පස් එකතු කරන්න. පේළි ක්‍රමයට සිටුවීමෙන් හෝ වැපිරීමෙන් වල් පාලනය මනාව කළ හැකිය. මුල් මතු නොවන සේ පේළි දෙපසින් පස් එක් කරන්න.

### අස්වනු නෙලීම හා ගබඩා කිරීම

මාස 2-3කදී පමණ පඳුරු මෝරා කරල් හටගනී. එම අවස්ථාවේදී සම්පූර්ණ ශාකයම හෝ අතු කපා වියලා ගත හැකිය. හොඳින් වියළුණු පසු මිටි බැඳ වෙළඳපොළට ඉදිරිපත් කළ හැකිය. අස්වනු වාර කීපයක් ගැනීම වැඩි ආදායමක් ලැබීමට හේතු වේ.

### වර්තමාන භාවිතය හා වෙළඳපළ තත්ත්වය

ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය සඳහා අති බහුල භාවිතයකින් යුතු ඖෂධීය අමුද්‍රව්‍යයක් වන හීබ් බිං කොහොඹ කි. ග්‍රෑ භාවිතා කර ඇත.

වර්තමාන වෙළඳපල මිළ අනුව වියළි ශීන් බිං කොහොඹ කි. ග්‍රෑ එකක් රු 810.00 පමණ වෙයි.

සැකසුම
වෛද්‍ය ලක්ශාන්ත ගුණසිංහ
ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී-
ගගවට කෝරළය